# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

2 ශ්‍රේණිය -බුද්ධ ධර්මය - 2021 ජනවාරි මාසය - 3 වන සතිය

සැකසුම :- බලංගොඩ අධ්‍යාපන කලාපය.

M.A.R.P. කුමාරි - ර/රත්මලවත්ත මහා විද්‍යාලය

පින් බිමට යන බොදු දරුවෝ - 2 පාඩම

දුවලා පුතාලා ඉරිදා දහම් පාසල් යන්න කැමතියි නේද ?

ඒ වගේම ඔයාලා ගොඩක් කැමතියි නේ පන්සල් යන්න.දුවේ පුතේ ඔයාලා දන්නවාද පන්සල කියන්නේ පින්බිමක්.

පන්සලේදී ශබ්ද නගා හිනාවෙන්න,කතා කරන එක හොද නෑ.සංවරව හැසිරෙන්න ඕනි .

ඔන්න පුතාලා මීට පස්සේ පන්සල් ගියාම මෙන්න මේ වත් පිළිවෙත් කරමු. අපිට එතකොට ගොඩක් පිං ලැබේවි.

- බුදු පිළිම වහන්සේ,වෙහෙර වහන්සේ,බෝධීන් වහන්සේ ළග තියෙන මල් ආසන පිරිසිදු කරමු.
- විහාර මලුව,බෝ මලුව අතුගාමු.කුණු එකතු කර වළට දමමු.
- පූජාවෙන් පසු පහන් ,ගිලන්පස භාජන අස් කරමු.
- ඒවා නිසිතැන තබමු.අපි රැගෙන ගොස් ඉවත දමන දේවල් නැවත ගෙදරට රැගෙන එමු.

පුතාලා දන්නවාද අපේ බණ පොත්වල සදහන් වෙනවා මේ වගේ වත් පිළිවෙත් එක හිතින් සතුටින් කරපු අය දිව්‍යලෝකවල ඉපදිලා සැප විදිනවා කියලා .

එහෙම නම් පුතාලා හොදට මතක තියාගෙන ඒ ටික කරමු.දැන් මට එහෙමනම් කියන්න පන්සලට ගොස් වදින ස්ථාන පිළිවෙළින්.

ඔයාලා ඒක පොතේ අදින්න.

මේ පාඩමට අදාළ වීඩියෝ පාඩම සදහා you tube එකට ගොස් Renuka kumari . පින් බිමට යන බොදු දරුවෝ. ලෙස type කරන්න.

**“හොදයි ආදරණිය දුවේ, පුතේ ඔයාලට තෙරුවන් සරණයි!”**